# හින්දු පත්තිනි දේව ඇදහිල්ල ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමේදී සිංහල බෞද්ධ මුහුණුවරේ ප්‍රබලත්වය පිළිබඳ අධ්‍යයනයක්

*දීප්තිකා, එච්. ජී. සංජි [1] සහ ගුණරත්න, එම්. ඩී. නර්මදා ගයාත්‍රි [2]*

පත්තිනි, දක්ෂිණ භාරතීය දෙවඟනක් වන අතර, පතිව්‍රතා ධර්මය මූලික කොට ගනිමින් බිහි වූ දේවතාවියකි. පත්තිනි මෑණියන් හින්දු දෙවඟනක් ලෙස සලකන්නේ හින්දු මාතෘ දේව සංකල්පය හා බද්ධ කිරීමේ අරමුණ හේතුවෙනි. පත්තිනි හෙවත් කන්නකී දේවතා සංකල්පය බිහිවීමට පදනම් වූ මතවාද කිහිපයක් වන අතර, වඩාත් කැපී පෙනෙන්නේ කන්නකී-කෝවළන් හා බැඳි පුරාවෘත්තයයි. පසු කලෙක හින්දූන් විසින් ඇය පාර්වතී ඇදහිල්ල සමගද, දක්ෂිණ භාරතීයයන් කාලී, දුර්ගා ඇදහිල්ල සමගද සමාග්‍රහණය කොට ගන්නා ලදි. ගජබා රාජ්‍ය සමය තුළ ගජබා රජුගේ මූලිකත්වයෙන් ඉන්දියාවේ සිට පත්තිනි දේවියගේ රුවන් සළඹත්, වලගම්බා රජු දවස ගෙන ගිය පාත්‍ර ධාතුවත් වැඩම කිරීමෙන් අනතුරුව හින්දු පත්තිනි දේව ඇදහිල්ල මෙරට ප්‍රතිව්‍යාප්ත වූ බව පැවසේ. මේ වනවිට පත්තිනි ඇදහිල්ල ඉන්දියාව තුළ මෙන්ම ශ්‍රී ලංකාව තුළද ජනප්‍රිය ආගමික සංකල්පයකි. ශ්‍රී ලංකාවේ පත්තිනි දේව ඇදහිල්ල පිළිබඳව හින්දු දේව සංකල්පයට එහා ගිය සිංහල බෞද්ධ ආභාෂයක් මෙම සංකල්පය තුළ විද්‍යාමාන වන්නේය යන මූලික අභිමතාර්ථය මත පදනම්ව කරුණු ගවේෂණයට ලක් කෙරේ. එහිදී මේ හා සම්බන්ධ රචනා වූ කෘති, දෘශ්‍යමාන සාක්ෂි ආදි මුලාශ්‍රය පදනම් කර ගැනේ. මෙහිදී පත්තිනි දෙවඟන සඳහා බෝධිසත්ව සංකල්පයක් ආරෝපණය කිරීමත්, දරු සම්පත් ලබාදෙන දෙවඟනක් සේ සැලකීමත්, බෞද්ධාගමික සිද්ධස්ථානවල වැඳුම්-පිදුම් කරන දේවතාවිය ලෙසත් බෞද්ධයන්ගේ ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වේ. මෙයින් පැහැදිලි වන්නේ හින්දු පත්තිනි දේව ඇදහිල්ල ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමේදී සිංහල බෞද්ධ මුහුණුවරක් අතීතයේ මෙන්ම වර්තමානයේද පිළිබිඹු වන බව මුලාශ්‍රය ආශ්‍රයෙන් සනාථ කළ හැකි බවයි.

**ප්‍රමුඛ පදඃ පත්තිනි, හින්දු දේව ඇදහිල්ල, හින්දු දේව සංකල්පය**

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*sanjideepthikagamage@gmail.com*
[2]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*narmadagunarathna9276@gmail.com*